# ධම්මපදය

## බාල වර්ගය (08 ගාථාව)

**08.** ගාථාව

**"න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති,**

**යස්ස අස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවති."**

පදගතාර්ථය

| | | |
|---|---|---|
| **යං කත්වා** | - | යමක් කොට |
| **අනුතප්පති** | - | පසුතැවේ ද |
| **තං කම්මං** | - | ඒ කර්මය |
| **කතං** | - | කරන ලද්දේ නම් |
| **න සාධු** | - | නො මැනවි |
| **යස්ස** | - | යම් කර්මයක් පිළිබඳ වූ |
| **අස්සුමුඛෝ** | - | කඳුලින් වැකුණු මුහුණු ඇත්තේ |
| **රෝදං** | - | හඬන්නේ |
| **විපාකා** | - | විපාකය |
| **පටිසේවති** | - | අනුභව කරයි |

භාවාර්ථය

යම් කර්මයක් කොට පසුතැවේ ද, යම් කර්මයක විපාකය කඳුලින් වැකුණු මුහුණු ඇති ව හඬමින් විඳී ද, එබඳු කර්මය කරන ලද්දේ නම් නො මැනවි.

නිදන කථාව

අප බුදුපියාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සමයෙහි ගොවියෙක් කුඹුරක් සාමින් සිටියේ ය. එදිනට පළමු-ද රාත්‍රි, සොරු සමූහයක් දිය-සොරොවුවකින් නුවරට ඇතුළු ව ඉසුරුමතෙකුගේ නිවසෙහි තිබූ බොහෝ රන්, රිදී, මුතු, මැණික් ආදි බොහෝ වස්තු රැගෙන දිය-සොරොවුවෙන් ම නික්මුණාහ.

ඔවුන් අතර සිටි එක් සොරෙක් අනික් සොරුන් රවටා දහසක් බැඳි පොට්ටනියක් ඔඩොක්කුවෙහි ලා ගත්තේ ය. සියල්ලෝ ම සාන කුඹුර ළඟට ගොස් එහි දී ගත් අනික් බඩු බෙද ගත්හ. පළමු කී සොරා සඟවා ගත් දහසක් බැඳි පොට්ටනිය කුඹුරේ වැටී අමතක වී ගියේ ය.

එදවස සම්මාසම්බුදුපියාණන් වහන්සේ අලුයම් වේලාවෙහි ලොව බලා වදරන සේක් ගොවියා ද ඔහුට සිදු වන විපත ද සෝවාන් මඟට පැමිණීමෙන් සිදු වන යහපත ද දැක, ආනන්ද තෙරුන් සමඟ අලුයම කුඹුරට වැඩි සේක.

ගොවියා උදැසන ම සීසාන්නට කුඹුරට ගියේ ය. කුඹුරට වඩින්නා වූ බුදුපියාණන් වහන්සේ දැක වැඳ, සීසෑමෙහි යෙදුනේ ය. බුදුරජාණන් වහන්සේ ද ඔහු සමඟ කිසිත් කථා නො කොට මුදල්-පොදිය වැටී තිබුණු තැනට වැඩමවා මුදල්-පොදිය දැක, 'ආනන්ද! බලන්න! සර්පයෙකැ'යි වදාළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද 'එසේය ස්වාමීනි! දකිමි, ඝෝරවිෂ ඇති සර්පයෙකැ'යි වදාළ සේක.

ගොවියා ඒ කථාව අසා 'මා මේ වේලාවෙහිත් අවේලාවෙහිත් හැසිරෙන මේ තැන සර්පයෙක් සිටී'යි සිතා, 'හොඳයි, බුදුරජාණන් වහන්සේ වැඩියාට පසු බලන්නෙමි'යි සිතා බුදුරජාණන් වහන්සේගේ වැඩම කිරීම සිදු වූවාට

පසු කෙවිට ද ගෙන එහි ගියේ ය. සර්පයෙකු නො දැක මුදල්-පොදිය දැක එය ගෙන බුදුරජාණන් වහන්සේ වදළේ මේ ගැන ය'යි සිතා එය ගෙන වළ ලා තබා සාන්නට පටන් ගත්තේ ය.

නිවැසියෝ ද පහන් වූ කල්හි සොරුන් ගේ බිඳ, එහි තිබණු බඩු ගෙන ගිය බව දැක, සොරුන්ගේ අඩිපාරේ ගොස් බඩු බෙදූ තැන දැක, එහි හොඳින් විමසා බලා ගොවියාගේ අඩි පාරේ ගොස් මුදල්-පොදිය තිබූ තැනට පැමිණ පස් ගොඩ දමා මුදල්-පොදිය ගෙන 'නුඹ අපේ ගෙය පැහැර ගෙන අවුත් සීසාන්නෙකු මෙන් හැසිරෙහි'යි තර්ජනය කොට අතින් පයින් තළා පෙළා රජු ඉදිරියට ගෙන ගියහ. රජු තොරතුරු අසා ඔහු මැරීමට අණ කළේ ය.

ගොවියා වධයට යන ගමනෙහි දී අන් කිසිවක් නො කියා "ආනන්ද! බලන්න! සර්පයෙක්" "එසේ ය ස්වාමීනි! සෝරවිෂ සහිත සර්පයෙකැ"යි කිය කියා ගියේ ය.

රාජපුරුෂයෝ එය අසා, "තෝ බුදුරජුන්ගේත්, ආනන්ද තෙරුන්ගේත් කථා කියන්නේ කවර කරුණක් කරණ කොට ගෙන දැ"යි ඇසූහ.

ගොවියා, "රජු දැක රජු ඉදිරියෙහි ම කියන්නෙමි"යි කී කල්හි, රජු වෙත ගොස් සියලු තොරතුරු දන්වා සිටියේ ය. රජ තෙමේ ඔහුගේ කථාව අසා "මොහු බුදුපියාණන් වහන්සේ තමාගේ සාක්ෂිකරු හැටියට ඉදිරිපත් කෙරෙයි. සොයා බලන්නෙමි"යි කියා ගොවියා සමග සවස් වේලාවෙහි බුදුරජාණන් වහන්සේ වෙත ගොස් කරුණු විමසා ගොවියාගේ නිදෙස් බවට කරුණු දැන, "ස්වාමීනි, මේ ගොවියා තථාගතයන් වහන්සේ වැන්නෙකු ම සාක්ෂිකරු කොට නො දැක්වී නම් දිවි නො ලබන්නේ"යි රජු විසින් කී කල්හි, ස්වාමිදරු වූ බුදුරජාණන් වහන්සේ "මහරජ එසේ ය, මමත් එය ම සිතා ගියෙමි" වදළේ ය.

"නුවණැත්තහු විසින් යමක් කොට නැවත ඒ ගැන පසුතැවිලි වේ නම් එබඳු දේ කිරීම නුසුදුසු ය. එබඳු දේ නො කළ යුතු ය"යි වදරා, අනුසන්ධි ගළපා ධර්මය දේශනා කරන්නේ, "නතං කම්මං කතං සාධු" යන ගාථාව වදළ සේක. ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන්ඵලාදියට පැමිණියාහ.

**ආත්මෝපදේශය** - ඇමක් ගිලපු මසෙක් මෙන් අනුන්ගේ බස් ගෙන පසු ව නො තැවෙන්න..

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
'සදහම් සෙවණ'
**(දුරුතු 2554)**

**සම්පාදක:** බුලත්සිංහල, ධම්කෙත අරණ්‍ය සේනාසනාධිවාසි පූජනීය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදානය:** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට වහා චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගැනීම පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net**
*යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya - 2011**